www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජනාධිපති බුෂ් පාකිස්ථානය තුල එක්සත් ජනපද ගොඩබිම් මෙහෙයුම්වලට අවසර දෙයි

## President Bush Authorises US ground operations inside Pakistan

**පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2008 සැප්තැම්බර් 12**

ඇෆ්ගනිස්ථානය තුල වර්ධනය වන මහජන කැරලි මර්දනය කිරීමේ සාහසික සහ සාපරාධී ප්‍රයත්නයක් ලෙස, පාකිස්ථාන දේශ සීමා ප්‍රදේශ තුල ඉලක්කයන්ට එරෙහි ප්‍රහාර සඳහා එක්සත් ජනපද විශේෂ බලකායන් යොදා ගැනීම සඳහා ජනාධිපති බුෂ් රහසිගතව අවසර දී තිබේ. ප්‍රසිද්ධියේ පිලිගත් ප්‍රථම මෙහෙයුම සිදු වුනේ සැප්තැම්බර් 3 වෙනිදා ය. එදින දකුනු වසිරිස්ථානයේ ගමකට හෙලිකොප්ටර්වලින් ගොඩ බැස්ස සොල්දාදුවෝ නිවාස ප්‍රදේශ තුනකට පහර දී අවම වශයෙන් මිනිසුන් 20 ඝාතනය කලහ.

ප්‍රහාරය පාකිස්ථානය පුරා ම පෘථුල මහජන කෝපයක් අවුලුවා ලීය. ඊයේ, *නිව්යෝර්ක් ටයිම්ස්* පත්‍රයට අනුව හෙලිකොප්ටර්වලින් ප්‍රවාහනය කල 20 වැඩි නාවික හටයන් ඒසී 130 ප්‍රහාරක යානයක පිටුබලය ඇතිව "අල්කයිඩා සටන් කරුවන්" දුසිම් දෙකක් පමන ඝාතනය කලහ. එහෙත්, පාකිස්ථාන නිලධාරින් කාන්තාවන් හය දෙනෙකු සහ ලමුන් දෙදෙනෙකු ඇතුලු ප්‍රහාරයට ගොදුරු වූවන්ගේ සවිස්තරාත්මක ලැයිස්තුවක් ඉදිරිපත් කර තිබේ. මියගිය සියල්ලෝ ම සාමාන්‍ය ගම්මුන්ය. ඔවුන් අතර විදේශිකයන් හෝ අල්කයිඩා සටන්කරුවන් එක් අයකු හෝ නොසිටියේ ය.

පසුගිය සතියේ දකුනු වසිරිස්ථානයට එල්ල කල එක්සත් ජනපද මිසයිල් ප්‍රහාර තුනෙන් පසුව සිදු වූ මෙම ප්‍රහාරය ධවල මන්දිර ප්‍රතිපත්තියේ නිශ්චිත මාරුවක් සලකුනු කරනු ලබයි. පකිස්ථාන ආන්ඩුවේ පූර්ව අනුමැතියකින් තොරව පාකිස්ථානය තුල ගොඩබිම් ප්‍රහාර සිදු කිරීමට එක්සත් ජනපද විශේෂ බලකායන්ට අවසර දෙන රහසිගත නියෝගයකට ජූලි 10 වෙනි දා ජනාධිති බුෂ් අත්සන් කල බව ඇමරිකන් නිලධාරීහු ඊයේ *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රය තුල තහවුරු කලහ.

නම් සඳහන් නොකල ජ්‍යෙෂ්ඨ එක්සත් ජනපද නිලධාරියෙක් පත්‍රයට මෙසේ පැවසුවේ ය: "ගෝත්‍රික ප්‍රදේශවල තත්වය ඉවසා සිටිය නොහැකි ය. අපි අපේ බලය වඩාත් ස්ථාවර කල යුතු වෙමු. නියෝග නිකුත් කර තිබේ. ජනාධිපතිගේ තීන්දුව, ෆෙඩරල් ක්‍රමයට පාලිත ගෝත්‍රික ප්‍රදේශවල (එෆ්ඒටීඒ) සටන්කාමී කන්ඩායම් මර්දනය කිරීම සඳහා පාකිස්ථාන ආන්ඩුව සහ මිලිටරිය අපොහොසත් වීම ගැන කර්කෂ විවේචන සිදුවූ දින වල බුෂ් පරිපාලනය තුල ඉහල මට්ටමේ දීර්ඝ විවාදයක කුලු ගැන්වීමකි.

"මිත්‍රශීලී රටක් තුල සීමිත හෝ ගොඩබිම් ප්‍රහාර මෙහෙයවීම එක්සත් ජනපදයට කැඳවුම් කර ඇත්තේ කවර නීතිමය බලධාරින් දැයි හරියට ම පැහැදිලි නැත" යි *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රය ප්‍රවේශම් සහගතව සඳහන් කලේ ය. ඇත්ත වශයෙන් ම, කවර රටක හෝ - මිත්‍රශීලී හෝ මිත්‍රශීලී නොවන - දේශ සීමා තුල සිදු කරන මිලිටරි ප්‍රහාර යුදමය ක්‍රියාවකි. ඉස්ලාමාබාද් සීමාසහිත ගොඩබිම් මෙහෙයුම් පිලිබඳ පොදු සංකල්පය පුද්ගලිකව පිලිගෙන ඇති බව එක්සත් නිලධාරියෙකු ප්‍රකාශ කල නමුදු, එක්සත් ජනපද හමුදා විසින් සිදු කරනු ලබන කවර හෝ අනවසර ප්‍රහාරයකට පාකිස්ථාන ආන්ඩුව ප්‍රසිද්ධියේ විරුද්ධත්වය ප්‍රකාශ කල අතර සැප්තැම්බර් 3 මෙහෙයුම සම්බන්ධයෙන් නිල විරෝධතාවය ප්‍රකාශ කලේය.

*නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රයේ ලිපිය ගැන අදහස් ප්‍රකාශ කිරීම ධවල මන්දිරය ප්‍රතික්ෂේප කලේ ය. එහෙත් අඟහරුවාදා ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කල කතාවක දී ඉරාකය හා ඇෆ්ඝනිස්ථානය සමග පාකිස්ථානයේ කොටස් "එකම සමස්ථ අරගලයක්" බව ප්‍රකාශ කරමින් එක්සත් ජනපද ස්ථාවරයේ සිදුව ඇති වෙනස ඇඟවුම් කලේ ය. ඇෆ්ඝනිස්ථානය තුල එක්සත් ජනපද හමුදා තව දුරටත් ශක්තිමත් කිරීමක් ද ඔහු නිවේදනය කලේ ය.

වර්තමාන සහ හිටපු ඇමරිකානු නිලධාරීන් සමග වෙන වෙනම කල සම්මුඛ සාකච්ඡාවල දී බීබීසී සහ ඇසෝසියේටඩ් ප්‍රෙස් යන දෙකම *නිව් යෝර්ක් ටයිම්ස්* වාර්තාව සනාථ කලහ. එක්සත් ජනපද පාබල හමුදාවලට පාකිස්ථාන දේශ සීමාවන් හරහා කැරලිකරුවන් ලුහුබැඳ යාමට ද බුෂ් පරිපාලනය අවසර දී තිබූ බව හිටපු බුද්ධි නිලධාරියකු ඇසෝසියේටඩ් ප්‍රෙස් ප්‍රවෘත්ති සේවය පැවසුවේ ය.

පාකිස්ථාන මිලිටරි බුද්ධි අංශය - අන්තර්සේවා බුද්ධි අංශය - (අයිඑස්අයි) ඉහත දී එක්සත් ජනපද මෙහෙයුම් අඩාල කල අතර ඇෆ්ගනිස්ථානය තුල කැරලිකරුවන්ට උදව් කරන්නට ඇතැයි ප්‍රකාශ කරමින් තවත් එක්සත් ජනපද නිලධාරියෙකු බුෂ්ගේ රහස්‍ය නියෝග සාධාරනීකනරය කලේ ය. "මෙය (නව නියෝගය) එයට ප්‍රතිචාරයක් වන අතර පාකිස්ථානු බුද්ධි සේවාවන් විනිවිදීම ගැන තොරතුරු හෙලිදරව් වීම මගින් එය කඩිනම් විය. අපේ කොමාන්ඩෝවරුන්ගේ අත් නිදහස් කිරීම හැර වෙනත් විකල්පයක් නොතිබූ හෙයින් එම තීන්දුව ගත් බව" එම නිලධාරියා ඇසෝසියේටඩ් ප්‍රෙස් ප්‍රවෘත්ති සේවයට පැවසුවේ ය.

අයිඑස්අයි හි සමහර කොටස්වල ක්‍රියාවන් කවරක් වුව ද ඇෆ්ඝනිස්ථානය තුල කැරලිකාරිත්වය ඉහල යාමේ මූලික හේතුව වන්නේ එක්සත් ජනපදය මූලිකත්වය දරන රටේ නව විජිතවාදී වාඩි ලා ගැනීමේ ස්වභාවය යි. සිවිල් ජනයා දහස් ගනනක් මරනයට පත් වීම හෝ සිරගත කිරීමට තුඩු දී ඇති. වසර පහකට ආසන්න කාලයක් එල්ල කරන ගුවන් ප්‍රහාර සහ හමුදා වැටලීම් විශේෂයෙන්ම ඇෆ්ඝනිස්ථානය හා පකිස්ථාන දේශ සීමා අතරට මැදිව සිටින පස්තුන් ගෝත්‍රිකයන් අතර බරපතල ප්‍රතිරෝධයක් අවුලුවා ඇත. දකුනු සහ නැගෙනහිර ඇෆ්ඝනිස්ථානයේ වැඩි පදාසයක් විනාශ කිරීමෙන් පසුව බුෂ් පරිපාලනය අසල්වැසි පකිස්ථානය තුල විනාශකාරී නව යුද්ධයක් දියත් කර ඇත.

ඇෆ්ඝනිස්ථානය තුල එක්සත් ජනපද යුද්ධය දැනටමත් පකිස්ථානය  මත ගැඹුරු අස්ථාවරකාරී බලපෑමක් ඇති කර තිබේ. වොෂින්ටනයේ පීඩනය යටතේ පකිස්ථාන මිලිටරිය 120,000 හමුදාවක් දේශසීමා ප්‍රදේශවලට යවා තිබේ. බරපතල ගැටුම් මගින් දෙපාර්ශවයේ ම බොහෝ දෙනෙක් මරනයට පත්වී ඇති අතර 300,000 පමන ජනයාට පලා යාමට සිදු විය. අවිචාරවත් ලෙස කාන්තාවන් සහ ලමුන් ඇතුලු සිවිල් ජනයා ඝාතනය කල සීඅයිඒ විසින් පාලනය කරනු ලබන ප්‍රහාරක යානා යොදාගනිමින් ගෝත්‍රික ප්‍රදේශවලට එක්සත් ජනපදය එල්ල කරන මිසයිල් ප්‍රහාර සංඛ්‍යාව ඉහල යාම කෙරෙහි දේශීය ගෝත්‍රික ජනයා බියට සහ නොසන්සුන්තාවයට පත්ව සිටිති.

## පකිස්ථානු කෝපය

පකිස්ථානය තුල ඒකපාර්ශවීය එක්සත් ජනපද ගොඩබිම් ප්‍රහාර සඳහා අනුමැතිය දීම ආන්ඩුව සහ මිලිටරිය බෙහෙවින් අපහසුවට පත් කර තිබේ. "එවැනි කුලප්පු සහගත ක්‍රියාවන් සටන්කාමීන්ට උදව්වක් වන අතර තව දුරටත් ප්‍රදේශය තුල සටන්කාමීත්වයට ඉන්ධන සපයනු ඇතැයි" පසුගිය සතියේ ප්‍රහාරය ගැන සඳහන් කරමින් පකිස්ථානු මිලිටරි ප්‍රධානිජෙනරාල් අස්ෆැක් කයානි බදාදා ප්‍රකාශ කලේ ය. " දේශ සීමාවේ අපේ පැත්තේ මෙහෙයුම් සිදු කිරීම සඳහා සංධාන හමුදා සමග ගිවිසුමක් හෝ එකඟතාවයක් පවති බව" ඔහු තරයේ ම ප්‍රතික්ෂේප කලේ ය.

එක්සත් ජනපදය සහ පකිස්ථානය අතර ගැටුමක සම්භාවිතාව සම්බන්ධව කල ඇඟ කිලිපොලන අනතුරු ඇඟවීමක දී "හැකි සියලු ආකාරයෙන් ම රටේ ස්වාධිපත්‍යය සහ භෞමික අඛන්ඩතාවය ආරක්ෂා කරනු ඇත" යි ජෙනරාල් කයානි සඳහන් කලේ ය. කලින් වොෂින්ටනයේ හිතවාදියෙකු ලෙස සලකනු ලැබූ කයානි එවන් ප්‍රකාශයක් කිරීමේ අර්ථය වන්නේ එක්සත් ජනපද ප්‍රහාර නිසා පකිස්ථානු මිලිටරිය තුල ගැඹුරු ඉරි තැලීමක් සිදු වී ඇති බවය. ෆෙඩරල් ක්‍රමයට පාලනය කෙරෙන ගෝත්‍රික ප්‍රදේශවල සිදු කෙරෙන හමුදා මෙහෙයුම් සම්බන්ධයෙන් ප්‍රාදේශීය පශ්තුන් ගෝත්‍රිකයන්ට හිතවාදීව සිටින බොහොමයක් හමුදා නිලධාරීන් විරුද්ධත්වයක් අවුලුවා තිබේ.

පකිස්ථානයේ එක්සත් ජනපද වාඩිලා ගැනීමට සහ වංචනික "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ට පකිස්ථානය සහයෝගය දීම ඉන්දියාවට එරෙහිව මූලෝපායාත්මක අවශ්‍යතාවන්වල දී පකිස්ථානයේ තත්වය දුර්වල වී ඇති බවට හමුදා ප්‍රධානීන් තුල ගැඹුරු හැඟීමක් ඇති වී තිබේ. පාකිස්ථානයේ වැදගත් සහායකයෙකු ලෙස සැලකුන ඇෆ්ඝනිස්ථානයේ තලිබාන් තන්ත්‍රයට දෙන සහයෝගය ඉවත් කර ගන්නා ලෙස සැප්තැම්බර් ප්‍රහාරයෙන් පසුව වොෂින්ටනය හිටපු පකිස්ථානු ප්‍රබල නායකයා වූ පර්වේස් මුෂාරෆ් මත බරපතල පීඩනයක් යෙදී ය. එක්සත් ජනපදයේ පිටුබලය ලත් රූකඩ ජනාධිපති හමීඩ් කර්සායි ඉන්දියාව සමග සමීප සබඳතා ගොඩ නගාගෙන ඇති තත්වයකට පාකිස්ථානය මුහුන දී ඇත. ඒ සමඟ ම " ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ප්‍රමානවත් තරම් සහය නොදීම ගැන ඉස්ලමාබාදයට චෝදනා කරන අතර එක්සත් ජනපදය ඉන්දියාව සමග සමීප මූලෝපායාත්මක සබඳතා ගොඩනගාගෙන තිබේ.

සර්ධාරි දිගටම කයානිගේ අසාමාන්‍ය ප්‍රකාශය පෙරදින නිල වශයෙන් තනතුරෙහි පිහිටුවනු ලැබූ ජනාධිපති අසිෆ් අලි සර්ධාරිට එරෙහි එකක් ලෙස සමහර ලේඛකයෝ සමපේක්ෂනය කරති. එක්සත් ජනපද විශේෂ හමුදා පාකිස්ථාන දේශසීමා තුල මෙහෙයුම්වල "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය"ට ඔහුගේ සහයෝගය ප්‍රකාශ කර ඇති අතර අඟහරුවාදා පැවති දිව්රුම් දීමේ උත්සවයට ඇෆ්ඝනිස්ථානු ජනාධිපති කර්සායිට ආරාධනය කලේ ය. එහෙත් පකිස්ථානුවන් ඇෆ්ඝනිස්ථානය තුල එක්සත් ජනපද වාඩි ලා ගැනීමට සහ පකිස්ථානය තුල කෙරෙන බලහත්කාර ප්‍රහාරවලට තදින්ම විරුද්ධ බව සර්ධාරි හොඳින්ම දන්නේ ය. කයානිගේ ප්‍රකාශයෙන් පසුව රටේදේශ සීමා ආරක්ෂා කිරීම සඳහා අගමැති සියාද් යුසුෆ් රාසා ගිලානි ඊයේ සපථ කලේ ය. "එක්සත් ජනපද කටයුතු සම්බන්ධයෙන්

හමුදා ප්‍රධානියාගේ අදහස්වලට මා ද එකඟ වන අතර අපගේ අදහස් අතර වෙනස්කම් නැත" යි ඔහු ප්‍රකාශ කලේ ය.

කයානිගේ ක්ෂනික අරමුනු කුමක් වුවත් ඔහුගේ ප්‍රකාශය පකිස්ථානු මහජනතාව තුල පවතින එක්සත් ජනපද විරෝධයේ සහ පාකිස්ථාන මිලිටරියේ සහ දේශපාලන සංස්ථාපිතය මුහුන දී සිටින අර්බුදයේ ගැඹුර පිලිබිඹු කරයි. ඇමරිකානු මූල්‍ය සහ මිලිටරි ආධාර මත විශාල වශයෙන් පාකිස්ථානය යැපෙන නමුත් ඒ සඳහා ගෙවන මිල ලෙස දේශපාලන අර්බුදය, ගැඹුරු වීම, මූලෝපායාත්මක තත්වයේ දුර්වලවීමක් සහ ගෝත්‍රික ප්‍රදේශවල තීව්‍ර වන යුද්ධයකට මුහුන දී සිටියි. පකිස්ථානය තුල එක්සත් ජනපද හමුදා යොදා ගැනීමට අනුමැතිය දීම මගින් බුෂ් පරිපාලනය දහනශීලී තත්වයක් දැනටමත් නිර්මානය කර තිබේ. ඉරාකයේ සහ ඇෆ්ඝනිස්ථානයේ මඩගොහොරු දෙකක් නිර්මානය කිරීමෙන් පසුව එක්සත් ජනපදය තෙවැන්නක් නිර්මානය කිරීමේ මාවතට පිවිස සිටියි.

© www.wsws.org